**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---------------------------------------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 02 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරිගේ හා ගණන්දීමේ නිළධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛන විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කල යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරන බවට දන්වා ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.31,372,282 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.34,443,383 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.3,071,101 ක වෙනසක් පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්වල ශේෂ හා මූල්‍ය ප්‍රකාශන ශේෂ අතර සැසඳීමක් කළ යුතුවේ. | වෙනසක් නොමැති බව දන්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව වෙනත් ලැබීම්වල එකතුව රු.232,991,036 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශනවල එය රු.233,342,838 ක් වූයෙන් රු.351,802 ක වෙනසක් පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්වල ශේෂ හා මූල්‍ය ප්‍රකාශන ශේෂ අතර සැසඳීමක් කළ යුතුවේ. | එකතු කිරීමේ දෝෂයක් නිසා ඇති වී තිබෙන බව දන්වා ඇත |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් තුනකට අදාලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික ගිණුම් සාරාංශය සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර රු.15,881,645 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්තා සැසඳීමක් කළ යුතුවේ. | භාණඩාගාරයෙන් සිදුකරන ලද හර කිරීම් බව දන්වා ඇත. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක වැය ලෙජරයන් අනුව වියදම රු.449,232,312 ක් වූ අතර, එම වැය විෂයයන්ට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වටිනාකම රු.448,624,036 ක් වූයෙන් රු.608,276 ක වෙනසක් පැවතුණ එම වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | වත්කම් ගිණුම් තැබීම නිවැරදිව සිදුකළ යුතුවේ. | වෙනසක් නොමැති බව දන්වා ඇත. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඉඩම් වටිනාකම තුල මිශ්‍ර නාගරික ලෙස කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ රු.110,276,600 ක් වූ වටිනාකම තහවුරු කරගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වටිනාකම තහවුරු කරන සාක්ෂි ඉදරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | **ඇප ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින්ගේ තොරතුරු ඇතුලත් ලේඛනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වාගත යුතුවේ. | ලේඛන පවත්වාගෙන යාමට නිලධාරීන් දැනුවත් කල බව දන්වා ඇත. |
| **(ආ)** | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනයක් මැදිරිගිරිය, ඇලහැර, දිඹුලාගල හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුවේ. | ලේඛන පවත්වාගෙන යාමට නිලධාරීන් දැනුවත් කල බව දන්වා ඇත. |

(ඇ) **හානි පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගත යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | ලේඛන පවත්වාගෙන යාමට නිලධාරීන් දැනුවත් කල බව දන්වා ඇත. |

(ඈ) **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව පවත්වාගත යුතු වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතුවේ. | ලේඛන පවත්වාගෙන යාමට නිලධාරීන් දැනුවත් කල බව දන්වා ඇත. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලාදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලාදියි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිතුර ලැබී නොමැත. |
| (ආ) | විගණකාධිපති වරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුල සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.10 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා එලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ, 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරික්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1647 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මැදිරිගිරිය, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාහන සඳහා එහි සියලු උපාංග ඇතුලත් විස්තරාත්මක ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව සියලු උපාංග ඇතුලත් විස්තරාත්මක ඉන්වෙන්ට්‍රියක් පවත්වාගත යුතුවේ. | නිලධාරීන් දැනුවත් කල බව දන්වා ඇත. |
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති චක්‍රලේඛ අංක 2/2017 | රජයට අයත් සෑම මෝටර් වාහනයක්ම අදාල ආයතනය නමින් ලියාපදිංචි කල යුතු බවට විධිවිධාන දක්වා තිබුණද, දිඹුලාගල, වැලිකන්ද, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ලංකාපුර හා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබාදී තිබූ වාහන 34 ක අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | නිලධාරීන් දැනුවත් කල බව දන්වා ඇත. |
| (ඇ) | 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීමට කටයුතු යොදන ලෙසට උපදෙස් ලබාදී තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ධාවනයෙන් ඉවත් කරන ලද මෝටර් වාහන 08 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැලසුම්කල හා ඉල්ලුම් කල අග්‍රිම අතර වෙනස රු.16,211,222,000 ක් වූ අතර, ඉල්ලූ අග්‍රිමය හා ලද අග්‍රිමය අතර වෙනස රු.7,806,954,000 ක්ද, සැලසුම් කල අග්‍රිමය හා ලද අග්‍රිමය අතර වෙනස රු.7,951,616,000 ක් ද විය. | අග්‍රිමය සැලසුම් කිරීම නිසි පරිදි සිදුකළ යුතුවේ. | අග්‍රිම අවශ්‍යතාවය ප්‍රමාණවත් පරිදි භාණ්ඩාගාරයෙන් ලබා නොදී ඇති බව දන්වා ඇත. |

## 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසයක පදංචිව සිටි නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලිය වූ රු.153,600 අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වා ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට බදුකරුවන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.802,504 ක හිඟ ඉඩම් බදු ආදායම අයකර ගැනීම සම්බන්ධයෙන් මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. |
| (ඇ) | 2002 වර්ෂයේ සිට 2004 දක්වා වූ කාලය තුලදී නිල නිවාසයක් භාවිතා කිරීම වෙනුවෙන් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු ගණකාධිකාරි වරයෙකුගෙන් රු.21,050 ක මුදලක් අයවී නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදුකරුවන් 25 දෙනෙකු විසින් බදු මුදල් නොගෙවීම හේතුවෙන් රු.226,940 ක හිඟ බදු මුදල් හා පොලී මුදල් අය කල යුතුව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පසු විපරම් කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. |
| (ඉ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලීන බදු ඉඩම් කරුවන් 26 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු හිඟ බදු මුදල් වටිනාකම රු.475,069 ක් විය. | නිසි පරිදි බදු මුදල් අයකල යුතු අතර බදු නොගෙවන බදුකරුවන් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | බදු මුදල් අයකර ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |
| (ඊ) | විශ්‍රාම ලබා ඇති කාර්මික නිලධාරි වරයෙකු ගිවිසුම්ගත කාලය ඉක්මවා වසර 31 ක් රජයේ නිවාසයක පදිංචි වී සිටීම වෙනුවෙන් අයකල යුතු හිඟ දණ්ඩන කුලිය වූ රු.207,387 අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.1 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව නිවාස සන්තකය නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාගැනීමට කටයුතු කල යුතු අතර හිඟ දණ්ඩන කුලිය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | නිරීක්ෂණ සමඟ එකඟ වී ඇත. සන්තකය පවරාගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය ශීර්ෂ 06 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලද මුදලින් සියයට 16 ත් 67 ත් අතර, පරාසයක ප්‍රතිශතයක් වියදම් නොකර ඉතිරි වී තිබුණි. | නිසි පරිදි වියදම් ඇස්තමේන්තු කර වියදම් කළමනාකරණය කළ යුතුවේ. | වියදම් පාලනය කර අරපිරිමැසුම් ලෙස වියදම් දැරීම හේතුවෙන් බව දන්වා ඇත. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ශීර්ෂ 23 කට අදාල වැඩසටහන් 59 කට ලබාදී තිබූ රු.1,485,444,862 ක ප්‍රතිපාදනයන්ගෙන් සියයට 10 සිට සියයට 100 දක්වා වූ රු.443,703,581 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා භාවිතා කල යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 06 ක වැය විෂයයන් 09 ක් සඳහා ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.605,583 ක් ගෙවීම් කර තිබුණි. | අනුමත සීමාව තුල වියදම් දැරිය යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මධ්‍යම රජයේ අත්තිකාරම් ලේඛන අනුව 2000 වර්ෂයේ සේවය හැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.45,075 ක ණය ශේෂයක් පැවතුණි. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකි නම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) | දිඹුලාගල සහ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරමින් සිට වැඩ තහනමට ලක්වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.554,463 ක් වූ සේවක ණය ශේෂයන් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළාත් සභා අත්තිකාරම් ගිණුම යටතේ මධ්‍යම රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලට හා පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගේ රු.155,126 ක් වූ ණය ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජූලි 14 දිනැති 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත වූ මුදල් රෙගුලාසි 371(5) අනුව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් ඇතුලත එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, 2019 වර්ෂය තුලදී වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවස්ථා 10 කදී එකතුව රු.297,900 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම දින 04 සිට දින 165 දක්වා වූ කාල පමාවකින් පසුව පියවා තිබුණි. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවස්ථා 15 කදී ලබාදී තිබූ එකතුව රු.279,585 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 16 සිට දින 200 දක්වා වූ කාල පමාවකින් පසුවද, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 13 කදී ලබාගත් එකතුව රු.465,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 50 සිට දින 290 දක්වා කාල පමාවකින් පසුවද පියවා තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය ඉටු කර දින 10 ක් ඇතුලත පියවිය යුතුවේ. | නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |

## 2.7 තැන්පත් ශේෂයන්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක්ම අවසානයේදී කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුවත්, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එසේ කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳ සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තුවක් පිළියෙල කළ යුතුයි. | නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |
| (ආ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ රු.87,495 ක් වටිනා තැන්පතු 13 ක් සඳහා මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව විමසීම් කර රාජ්‍යය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් රාජ්‍ය ආදායමට ගත යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඇ) 2019 වර්ෂයේදී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් විවිධ වැඩසටහන් සඳහා ලද මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට එම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.1,201,000 ක් වටිනා තැන්පත් 07 ක් උපයෝජනයකින් තොරව වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබුණි. | අදාල කාර්යය සඳහා උපයෝජනය කළ යුතුවේ. | තැන්පතු 07 න් එක් තැන්පතුවක් හැර අනෙකුත් තැන්පතු වලට අදාල ව්‍යාපෘති සිදුකර ඇති බව දන්වා ඇත. |

## 2.8 අග්‍රිම ශේෂය

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකල රු.1,601,143 ක නොපියවූ අග්‍රිම ශේෂයක් පැවතුණි. | සමාලෝචිත වර්ෂය අවසානයේදී පියවීමට කටයුතු කළ යුතුවේ. | මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කළ යුතු මුදල් නොලැබීම මෙම වෙනසට හේතුවී ඇති බව දන්වා ඇත. |

**2.9** **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැලිකන්ද සහ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2020 ජනවාරි බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි සඳහන් නිකුත් කර ඇති නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් තුල අඩංගු පිළිවෙලින් රු.28,885 ක චෙක්පතක් සහ රු.1,088,144 ක් වටිනා චෙක්පත් 10 ක් විගණිත දින වන 2020 පෙබරවාරි 10 දින වන විටත් ආදායකයන් වෙත භාරදීමකින් තොරව විෂයභාර නිලධාරීන් සතුව පැවතුණි. | චෙක්පත් අප්‍රමාදව ආදායකයන් වෙත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | චෙක්පත් හැකි විගස ආදායකයන් වෙත ලබාදීමට වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිළිතුරු ලැබී නොමැත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) 2018 මාර්තු 31 දිනැති අංක 2/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2018 ජනවාරි 29 දිනැති අංක 2/2018 දරණ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ප්‍රධාන සේවාවන් 05 ක් සඳහා වාර්ෂික ඉලක්ක තීරණය කළ යුතු වුවත්, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඒ සඳහා කඩිනමින් කටයුතු කරන බව දන්වා ඇත. |

3.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නෙල්සන්පුර නිල පියස වීදිය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මිනුම් උපකරණ කිසිවක් භාවිතා නොකර නිසි ප්‍රමිතියකින් තොරව කොන්ක්‍රීට් මිශ්‍රණය සිදුකර තිබුණි. තවද ඇස්තමේන්තුව ප්‍රකාරව මාර්ගයේ දෙපස කාණුව අඟල් 6 ක් වෙනුවට අඟල් 04 ක් පමණක් යොදා තිබුණු අතර පොලිතීන් ඇතිරීමකින් තොරව කොන්ක්‍රීට් දැමීම සිදුකර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව නියමිත ප්‍රමිතියකින් ව්‍යාපෘති සිදුකිරීමට කටයුතු කල යුතුවේ. | මිනුම් උපකරණ භාවිතා කරන ලෙස උපදෙස් දී ඇති බව දන්වා ඇත. |

3.3 **අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සුභිත පුරවර වැඩසටහන යටතේ මහවැලි අධිකාරිය සතු ඉඩමක රු.972,328 ක මුදලින් පරිගණක විද්‍යාගාරයක් ඉදිකර තිබුණද, තවදුරටත් සංවර්ධන කටයුතු කළයුතු බැවින් ගොඩනැගිල්ල ඌණ උපයෝජිතව පැවතුණි. | ඵලදායිව උපයෝජනය කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

**3.4** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.8,306,695 ක් වූ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ලද ප්‍රතිපාදනවලින් ප්‍රමාදයකින් තොරව ජනතාව වෙත ප්‍රතිලාභ ලබාදීම සිදුකළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

3.5 **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම ශක්ති සමිති 04 ක් විසින් ජීවනෝපාය සංවර්ධනයට ලබාදී තිබූ රු.994,825 ක්ද, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ එක් සමිතියකට යටිතල පහසුකම් සංවර්ධන සඳහා ලබාදී තිබූ රු.200,000 ක් ද හා ජීවනෝපාය සංවර්ධනය සඳහා සමිති 02 කට ලබාදී තිබූ රු.550,000 ක මුදල් ද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවේ. | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව දන්වා ඇති අතර ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිහිටුවන ලද ග්‍රාම ශක්ති සමිති 06 න් සමිති 02 ක් පමණක් ණය ලබාදීමට හැකිවන පරිදි විස්කෝ ණය සමිති පිහිටුවාගෙන තිබුණු අතර එක් සමිතියක් පමණක් ණය ලබාදී තිබුණි. ණය ලබාදීම සඳහා මෙම සමිතිවලට රු.4,663,350 ක් ලබාදී තිබුණද, ඉන් ලබාදී තිබුණේ රු.310,000 ක ණය මුදලක් පමණි. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවේ. | සමිති කටයුතු යථාවත් කිරීමට උපදෙස් දී ඇති බව දන්වා ඇත. |
| (ඇ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ 2018 වර්ෂයේ දී ලබාදුන් මුදලින් ජීවනෝපාය සංවර්ධන හා ධාරිතා සංවර්ධනය සඳහා උපයෝජනය කළ මුදල පිළිවෙලින් සියයට 32 හා සියයට 17 ක්ව තිබියදී දෙවන වාරිකයද ලබාදී තිබුණි. | ව්‍යාපෘතිවල සාර්ථකත්වය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කළ යුතුවේ. | මෙම වසරේ වඩා ක්‍රියාකාරි මට්ටමට ගෙන එන බව දන්වා ඇත. |
| (ඈ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ සමිති 03 කට ජීවනෝපාය සංවර්ධනය සඳහා ලබාදුන් මුදල්වලින් කිසිදු මුදලක් වියදම් කර නොතිබුණි. ධාරිතා සංවර්ධනය සඳහා ලබාදුන් මුදල්වලින් එක් සමිතියක් කිසිදු මුදලක් වැය කිරීමට අපොහොසත් වී ඇති අතර, තවත් සමිති දෙකක වැය කළ මුදල් ප්‍රතිශතය සියයට 8 ක් සහ 11 ක් වැනි පහල මට්ටමක පැවතුණි. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවේ. | ව්‍යාපෘති අරමුණු ළඟාකර ගනිමින් කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |

## 3.6 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------ |
| (අ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 හි 3.4 ඡේදයට පටහැනිව ග්‍රාම නිලධාරි කොට්ඨාශ සීමාවට පිටත ක්‍රියාත්මක වන ප්‍රජා පාදක සංවිධාන වෙත ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව බල ප්‍රදේශය තුල ස්වේච්ඡා සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරි නැමීම සිදුකළ යුතුවේ. | ප්‍රජා සංවිධානයකට කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි ප්‍රමාණයක නිරත විය නොහැකි නිසා ඊට ආසන්න වසමේ ප්‍රජා සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනමා ඇති බව දන්වා ඇත. |
| (ආ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කර තිබුණු අලුත්ඔය වසමේ අලුතින් ක්‍රීඩාගාරයක් ඉදිකිරීම, දිවුල්දමන දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩා පිටියක් සකස් කිරීම යන ව්‍යාපෘති අදාල සමිති විසින් උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. | ස්වේච්ඡා සංවිධාන වෙත පිරිනමා ඇති කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත් ලබාදී ඇත්නම් එවැනි සංවිධාන අසාධු ලේඛනගත කළ යුතුවේ. | ලිඛිත විමසීමක් සිදුකර අසාධු ලේඛනගත කරන බව දන්වා ඇත. |
| (ඇ) | 2019 වර්ෂය සඳහා මැදිරිගිරිය, වැලිකන්ද,ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 ආකෘතියට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති බවට දන්වා ඇත. |
| (ඈ) | ප්‍රසම්පාදන අත්පොතේ 3.9.1 සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2012 ජනවාරි 05 දිනැති 01/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 ඡේදයේ සඳහන් කරුණු සනාථ කර ගැනීමකින් තොරව තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රුපියල් මිලියන 90.33 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ගම්පෙරළිය වැඩසටහන යටතේ ඇති ව්‍යාපෘති 108 ක් ප්‍රජාපාදක සංවිධාන සඳහා ලබාදී තිබුණි. | ප්‍රසම්පාදන අත්පොත සහ අදාල චක්‍රලේඛ උපදෙස් අනුව ස්වේච්ඡා සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනැමිය යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව දන්වා ඇත. |
| (ඉ) | (i) පළමු අදියර 2017 නොවැම්බර් 25 දිනට පෙර නිම කිරීම, 2018 පෙර සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් කිරීමේ අවශ්‍යතාවය සහ ප්‍රාරම්භක වැඩ සඳහා යන වියදම | විනිවිදභාවයෙන් යුතුව තරඟකාරි මිළගණන් යටතේ ලංසුකරුවෙකුට | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | අඩුකරගැනීම යන හේතූන් දක්වමින් යෝජිත දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පලමු අදියර ඉටුකරන ලද ආයතනය වෙතම එහි දෙවන අදියර ඉටුකිරීමට ද පවරා තිබුණත් සත්‍ය වශයෙන් මෙම ව්‍යාපෘතිය පළමුවන හා දෙවන අදිරයන් 2020 මැයි 31 වන විටත් අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතිය ලබාදිය යුතුවේ. | |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රාරම්භක වැඩ (Prelimanaries) සඳහා වියදම පලමු අදියරට සාපේක්ෂව රු.38,471,918 කින් වැඩිවී තිබුණු අතර එකඟවන ලද මිලගණන් (Negotiated Rate) පළමු අදියරේ මිලගණන් මත තීරණය වී තිබුණද, ගෙවීම් කිරීමේදී එම මිලගණන් යොදාගෙන නොතිබුණි. මෙසේ පළමු අදියර මිළගණන් යොදා නොගෙන දෙවන අදියර සඳහා ගෙවීම් කිරීම නිසා රු.186,756,603 ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය. | එකඟ වූ මිළගණන් අනුව ගෙවිය යුතුවේ. | පළමු අදියර හා දෙවන අදියර අතර වර්ෂයකට වැඩි කාල පරතරයක් පැවතීම මීට බලපා ඇති බව දන්වා ඇත. |
| (iii) | ගිවිසුම ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ පළමු අදියර 2017 නොවැම්බර් 25 දිනට පෙර අවසන් කල යුතු වුවද 2019 දෙසැම්බර් 16 දින වන තෙක් අවසන් කර නොතිබුණි. මෙම ප්‍රමාදවීම වෙනුවෙන් අයකල යුතු රු.11,250,000 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. | නිසි පරිදි ප්‍රමාද ගාස්තු අඩුකළ යුතුවේ. | ඉංජිනේරුවරයා විසින් 2020 පෙබරවාරි 29 දින දක්වා දින දීර්ඝ කිරීම නිර්දේශ කර තිබූ බවට දන්වා ඇත. |
| (iv) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම් ප්‍රකාරව සහතික කරනු ලබන අවම අතුරු ගෙවීම (Interim Payment) රු.මිලියන 25 ක් වුවද, රු.මිලියන 25ට වඩා අඩු බිල්පත් සහතික කර තිබුණි. | ගිවිසුම්ගත ආකාරයට බිල්පත් සහතික කළ යුතුවේ. | කොන්ත්‍රාත්කාර ආයතනයේ මුදල් අවශ්‍යතාවය අනුව ගෙවීම් කර ඇති බවට දන්වා ඇත. |

## 3.7 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් සමෘද්ධි බැංකුව පවත්වාගෙන යාම සඳහා මහවැලි අධිකාරිය විසින් පවරා දී ඇති භූමියෙහි පවතින රජයේ නිවාස දෙකෙහි පුද්ගලයින් දෙදෙනෙකු අනවසරයෙන් පදිංචිව සිටින අතර, ඔවුන්ට නිවාස නැවත භාරදෙන ලෙස දන්වා තිබුණද, එම නිවාස නැවත භාරදී නොතිබුණි. ඔවුන් පදිංචි වී සිටින කාලය සඳහා කුලියක් ද අයකරගෙන නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමටත්, කුලී නිසි පරිදි අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල සෙවන කාර්යාල පිහිටි ඉඩම් 24 ක අයිතිය මහවැලි අධිකාරියෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දන්වා ඇත. |
| (ඇ) | නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී ඇති නිල නිවාසයක් දැනට භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින අතර, නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු.118,048 ක තක්සේරු වටිනාකමක් සහ මාසික තක්සේරු වාරික මුදල් රු.35,193 ගෙවිය යුතුව පැවතුණි. | නිවාසය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් හිඟ මුදල් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුවේ. | තක්සේරු වටිනාකම ගෙවීමට ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කරමින් පවතින බවට දන්වා ඇත. |
| (ඈ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින දිස්ත්‍රික් ලේකම් නමින් ඇති ලොරි බවුසරයක හා ට්‍රැක්ටර් බවුසර් දෙකක වටිනාකම හඳුනාගෙන වත්කම් ලෙස CIGAS වැඩසටහනට ඇතුලත් කර නොතිබුණි. | වත්කම්වල වටිනාකම ගිණුම්වලට ගත යුතුවේ. | CIGAS වැඩසටහනට ඇතුලත් කරන ලෙසට උපදෙස් ලබාදුන් බවට දන්වා ඇත. |

## 3.8 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | අංක 59-8974 දරන වාහනයේ 2010 ජූනි 25 දිනැති අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104(4) ප්‍රකාරව අවසන් පරීක්ෂණ වාර්තාව අනුව අනතුරට අදාල අලාභය වන රු.230,000 ක මුදල හිටපු දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් වරයෙකුගෙන් අයකර ගැනීමට තීරණය කර ඇතත් මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන්ට ලබාදීම සඳහා ඇණවුම් කර තිබූ රු.160,902 ක වටිනාකමක් සහිත සෙවිලි තහඩු 84 ක් පලුදුවී තිබුණද,සැපයුම්කරුගෙන් එම පාඩුව පියවා ගෙන නොතිබුණි. | අලාභය අයකර ගත යුතුවේ. | පලුදු නොවූ ශීට් ලබාදීමට අදාල ආයතනය එකඟතාවය ලබාදී ඇති බව දන්වා ඇත. |
| (ඇ) | රක්ෂණ ආයතනය වෙත දන්වා තිබූ තොරතුරුවල පරස්පරතාවයක් පවතින බැවින් හා රක්ෂණ ගිවිසුමේ කොන්දේසි කඩවී ඇති බව දන්වමින් හානියේ වටිනාකම ප්‍රතිපූර්ණය කිරීම රක්ෂණ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් 2018 ජූනි 05 දින NCLM-9315 දරන ලොරි රථය අනතුරට ලක්වීම නිසා සිදු වී තිබුණු රු.1,007,750 ක හානියේ වටිනාකම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මුදල් රෙගුලාසි අනුව අලාභය අයකර ගත යුතුවේ. | නිරීක්ෂණ පිළිගෙන ඇත. ඉදිරි කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |
| (ඈ) | PA-4979 අංක දරන කැබ් රථයට 2018 ඔක්තෝබර් 23 දින සිදුවූ රිය අනතුරෙන් වූ අලාභයේ වටිනාකම රු. 241,700 ක් ලෙසට ප්‍රාරම්භක පරීක්ෂණ මඟින් තක්සේරු කර තිබූ අතර, රක්ෂණ ආවරණය මඟින් ප්‍රතිපූර්ණය වූ වටිනාකම රු.165,450 කි. මුදල් රෙගුලාසි 104(4) විධිවිධාන ප්‍රකාරව පූර්ණ පරීක්ෂණයක් පවත්වා රජයට සිදුවූ රු.76,250 ක අලාභය අයකරගෙන නොතිබුණි. | හානි පිළිබඳ පූර්ණ පරීක්ෂණ පැවැත්විය යුතුවේ. | පොතෙන් කපා හැරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක PA-4979 දරන කැබ් රථය 2017 ජුනි 13 දින අනතුරට ලක්වීමෙන් සිදුවූ අලාභය රු.427,930 ක් බවට අනාවරණය කර තිබූ අතර, ඒ සඳහා රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය නොවූ රු.63,923 ක් වූ රජයට සිදුවූ අලාභය අයකරගෙන නොතිබුණි. | හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවසන් වාර්තාව ඉදිරිපත් වී නැත. අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. |

3.9 **විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

**-----------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් දෙකකට පිළිතුරු ලබාදී නොතිබුණි. | විගණන විමසුම් සඳහා නියමිත කාල රාමුව තුළ පිළිතුරු ලබාදිය යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

3.10 **කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති අංක 96/05 හා 1996 අගෝස්තු 01 දිනැති චක්‍රලේඛයේ 6(11) ඡේදය ප්‍රකාරව බදුකරුවන් වෙත මුදල් ගෙවිය යුතු නියමිත දිනට මාසයකටවත් පෙර දැන්වීම් යැවිය යුතු වුවත්, සියළු බදුකරුවන් වෙත එසේ දැන්වීම් යැවීමට ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | නියමිත දිනට දැන්වීම් යැවිය යුතුවේ. | නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. |
| (ආ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූජා භූමි 10 ක් සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කර නොතිබුණු අතර, රාජ්‍ය ආයතන 12 ක් සඳහා පැවරුම් සහතික ලබාදීම සිදුවී නොතිබුණි. | පූජා භූමි ඔප්පු හා පැවරුම් ලබානොදුන් ඉඩම් කෙරෙහි අවධානය යොමුකර එම සහතික ලබාදීමට කටයුතු කළ යුතුවේ. | අදාල ඔප්පු හා පැවරුම් ලබාදීමට කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 20-700006 යටතේ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ලැබූ නිලධාරියෙකුගේ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප ප්‍රතිලාභිනිය 2014 නොවැම්බර් 04 දින මිය ගිය බව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුවත් නොකිරීම නිසා එදින සිට 2016 ඔක්තෝබර් දක්වා රු.420,776 ක මුදලක් බැංකු ගිණුමට බැර කර තිබුණි. නමුත් වැඩිපුර ගෙවීම් කර ඇති මුදල ආපසු අයකරගෙන නොතිබුණි. | විශ්‍රාමිකයා මියගිය බව නොදැන්වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, අයථා ලෙස ලබාගත් මෙම මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඈ) | විශ්‍රාමික නිලධාරීන් 02 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවන ලද රු.717,828 ක මුදලක් දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණන දිනය වූ 2020 පෙබරවාරි 10 වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඉ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෝටර් රථ අංශයේ 2019 වර්ෂයේ ජනවාරි මාසයේ රැස්කල ආදායම් රු.2,501,253 ක් දින 03 ත් 19 ත් අතර ප්‍රමාදයකින්යුතුව බැංකුගත කර තිබුණි. | එදිනම හෝ අප්‍රමාදව මුදල් බැංකුගත කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ වකුගඩු දීමනා හා වැඩිහිටි දීමනා ලෙස ගෙවන ලද මුදලින් අදාල ප්‍රතිලාභීන් ලබා නොගත් රු.3,616,100 ක මුදලක් තැපැල් කාර්යාල විසින් දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාස 02 ත් 05 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ආපසු හරවා එවා තිබුණි. මෙම මුදල් පොරොත්තු ලේඛනයෙහි සිටින පුද්ගලයින් සඳහා ගෙවීමට කටයුතු කිරීමේ ක්‍රමවේදයක් කෙරේ අවධානය යොමු වී නොතිබුණි. | නොගෙවන ලද දීමනා කඩිනමින් ආපසු කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට ක්‍රමවේදයක් යෙදිය යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (උ) | 2018 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිබිදෙමු පොළොන්නරුව හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ව්‍යාපෘති යටතේ ඉදිකර ඇති කමත් 13 ක් සුදුසු ආයතන වෙතපවරා දී නොතිබීම නිසා ඒවායේ අළුත්වැඩියා කිරීම හා භාවිතය සම්බන්ධයෙන් කිසිවෙකු වෙත වගකීම පැවරී නොතිබුණි. | සුදුසු ආයතන වෙත පවරා නඩත්තුව හා භාවිතය විධිමත් කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ වැඩිහිටි දීමනාව, වකුගඩු දීමානා හා ආබාධිත දීමනා ගෙවීම් සඳහා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබුණු රු. 58,129,000 ක ප්‍රතිපාදන මුදලින් දීමනා ලෙස නොගෙවා රු. 1,466,700 ක් ආපසු යවා තිබුණි. | මුදල් ලබා නොගැනීමට හේතු හඳුනාගෙන අරමුදල් අනවශ්‍ය ප්‍රතිලාභීන් සිටීනම් ඔවුන් ඉවත් කර පොරොත්තු ලේඛනයේ සිටින පුද්ගලයින්ට හෝ ප්‍රතිලාභ ලබාදීමට කටයුතු සිදුකළ යුතුවේ. | අවම වශයෙන් මාස 03 ක් අඛණ්ඩව දීමනා ලබා නොගන්නා පුද්ගලයින් වෙනුවට පොරොත්තු ලේඛනගත පුද්ගලයින් ඇතුලත් කරන බව දන්වා ඇත. |
| (එ) | ඉඩම් කට්ටිකරුවන් 549 ක් වෙනුවෙන් 2015 වර්ෂයේ පවත්වන ලද ඉඩම් කච්චේරිය ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවලංගු කර තිබූ අතර කට්ටිකරුවන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවලංගු කරන ලද ඉඩම් කච්චේරි වෙනුවෙන් නැවත ඉඩම් කච්චේරි පැවැත්විය යුතුවේ. | ඉඩම් කොමසාරිස් වෙත සිහිකැඳවීම් ලිපි යවා ඇති බවත්, පිළිතුරු ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා ඇත. |
| (ඒ) | ඉඩම් අයිතිය පළාත් සභාවට ඇති වසම්හි ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනට ආරම්භ කර ඇති බදු ගොනු සංඛ්‍යාව 230 ක් වුවත්, ඉන් බදු අයකරන සංඛ්‍යාව 43 කට සීමාවී තිබුණි. | සියලු බදු ගොනුවලින් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ බදු අයකිරීම් කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත. |
| (ඔ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදු ලෙජරය අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට බදුකරුවන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ බදු මුදල් හා පොලිය රු.6,225,745 ක් වී තිබුණි. | හිඟ මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවට දන්වා ඇත. |
| (ඕ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීමනා පත්‍රයක් මඟින් ලබාදී ඇති ඉඩමක් ප්‍රදාන පත්‍රය ලබාගත් පරමාර්ථවලට පරිබාහිරව සම්ප්‍රේෂණ කුළුණු දෙකක් ඉදිකිරීමට යොදාගෙන තිබුණි. | දීමනා පත්‍ර සහිත ඉඩම් අදාල කොන්දේසි යටතේ උපයෝජනය කළ යුතුවේ. | වියිමත් පරිදි බැහැර කිරීමත් සිදුකර නොමැති බවත්, ඉඩම් හිමිකරු දීමනා පත්‍රය රජයට භාරදී නොමැති බවත් දන්වා ඇත. |
| (ක) | 2018 හා 2019 වර්ෂවලදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත මැදිරිගිරිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් යවන ලද මැනුම් නියෝග 455 ක් අතරින් මැනුම් නියෝග 274 ක් 2020 ජනවාරි 27 දින වන විටත් ලැබී නොතිබුණි. | මැනුම් නියෝග ගෙන්වා ගැනීමට අවධානය යොමුකල යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. |
| (ග) | 2019 වර්ෂය තුලදී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මැනුම් අධිකාරිය වෙත යවන ලද මැනුම් ඉල්ලීම් 380 ක් අතරින් 254 ක් සඳහා මැනුම් සිදුකර නොතිබුණු අතර එය ප්‍රතිශයක් ලෙස සියයට 66 කට අධික විය. | මැනුම් නියෝග ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබී නොමැති මිනුම් හඳුනාගත හැකි පරිදි ලේඛනයක් පවත්වා ගැනීමට උපදෙස් ලබාදී ඇති බවට දන්වා |

| | | | |
|---|---|---|---|
| | | | ඇත. |
| (ච) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූජා භූමි 29 ක් සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කර නොතිබුණි. | පූජා භූමි ඔප්පු නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. |
| (ජ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රාජ්‍ය ආයතන 190 ක ඉඩම් පැවරුම් ලබාදීම සිදුකර නොතිබුණි. | රාජ්‍ය ආයතනවලට ඉඩම් පැවරුම් ලබාදිය යුතුවේ. | පැවරීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. |

**3.11 බදුකරුවන්ගෙන් අයවිය යුතු ණය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ----------------------- |
| ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති අංක 96/05 හා 1996 අගෝස්තු 01 දිනැති චක්‍රලේඛයේ 6(11) ඡේදය ප්‍රකාරව බදුකරුවන් වෙත බදු මුදල් ගෙවිය යුතු නියමිත දිනට මාසයකටත් පෙර දැන්වීමක් යැවිය යුතු වුවත්, බදු කරුවන් අතුරින් 13 දෙනෙකු සඳහා එවැනි සිහි කැඳවීම් යැවීමට තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව බදුකරුවන් වෙත දැන්වීම් යැවීමට කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව දන්වා ඇත. |

3.12 **අවිධිමත් ගනුදෙනු**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ------------------------------ |
| (අ) | දිඹුලාගල හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විධිමත් සමීක්ෂණයක් සිදුකර ප්‍රතිලාභීන් තෝරා නොගෙන පාර්ලිමේන්තු මන්ත්‍රී විසින් නම් කරන ලද ප්‍රතිලාභීන් 136 දෙනෙකු සඳහා ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් එකතුව රු.2,199,356 ක් වටිනා උපකරණ මිළදීගෙන තිබුණි. | ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී විනිවිදභාවයකින් සිදුකළ යුතුවේ. | අනුමත දිනට ප්‍රතිලාභීන් හඳුනාගෙන ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ‘‘පැරකුම්පුර සී.පි. මාවත ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීම’’ ව්‍යාපෘතියට ගෙවීම් කිරීමේදී එහි ගැටි බැම්මේ (curb wall) ගැඹුර සඳහා මීටර් 0.074 ක් වෙනුවෙන් වැඩිපුර රු.52,437 ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් කිරීමේදී නිවැරදිව පරික්ෂා කර ගෙවීම් කල යුතු අතර, වැඩිපුර ගෙවීමක් පවතී නම් අධිභාර කල යුතුවේ. | අලාභය රැඳවුම් මුදලින් අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරළිය වැඩසටහන යටතේ අංක 252 බෝගස්වැව ග්‍රාම නිලධාරි වසමේ අංක 21 නිවසේ සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් සඳහා යොදවා තිබූ කම්බි ගැලවී ගොස් තිබුණු අතර ඇතැම් කම්බි කොන්ක්‍රීට් දමා ඇති පොලිතින් කවරයට යටින් යොදවා තිබුණි. තවද ඇතැම් ස්ථානවල කම්බි යොදවා නොමැති බවද නිරීක්ෂණය විය. | නිසි ප්‍රමිතියෙන් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු අතර ඒ පිළිබඳව නිසි අධීක්ෂණයක් තිබිය යුතුය. | එසේ සිදුවී නැති බවට දක්වා ඇත. |
| (ඈ) | 2015 සහ 2016 වර්ෂ සඳහා ද වලංගු වන පරිදි 2017, 2018 හා 2019 වර්ෂ සඳහා රජයේ නිවාසවල ආර්ථික කුලිය තක්සේරු කර තිබුණු ද, එම තක්සේරු කුලිය අයකර නොගෙන ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 වසරේ සිදුකර ඇති පැරණි තක්සේරු කුලිය පදනම් කරගනිමින් රජයේ නිවාස සඳහා ආර්ථික කුලිය අයකරගෙන තිබුණි. අඩුවෙන් අයකරගෙන තිබුණු මුදල රු.87,000 ක් විය. | නිවැරදිව තක්සේරුව මත බදු කුලී අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ වාරික අයකර ගැනීමටත්, නියමිත ආර්ථික කුලී අයකර ගැනීමටත් කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඉ) | වැලිකන්ද සංස්කෘතික මධ්‍යස්ථානය 2019 දෙසැම්බර් 31 දින වන විටත් විවෘත කර නොතිබුණු අතර ගොඩනැගිල්ල වටා ඇති වැට අලින් විසින් විනාශ කර තිබුණි. මේ සඳහා රු.97,748 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර කරනු ලබන ගෙවීම් අයකරගත යුතුවේ. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. |
| (ඊ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සඳහා රු.409,161 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර කරනු ලබන ගෙවීම් අයකරගත යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව දන්වා ඇත. |
| (උ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග මීටර් 266.15 ක් සකස් කිරීම සඳහා | වැඩිපුර කරනු ලබන ගෙවීම් අයකරගත යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් කර තිබුණද භෞතික පරීක්ෂාවේදී සකස් කර තිබුණේ මීටර් 258.1 ක් බැවින් රු.114,442 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඍ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගම්පෙරළිය ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සිදුකරන ලද ව්‍යාපෘතීන්වල රේටයන් ගණනය කිරීමේදී පළාත් මිලගණන් මඟ හැර මිලගණන් තීරණය කිරීම හේතුවෙන් රු.2,646,747 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පළාත් මිළ ගණනය සැලකිල්ලට ගත යුතුවේ. | රජයට අලාභයක් සිදුවී නොමැති බව දන්වා ඇත. |

## 3.13 අනුමත නොකළ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යෝජිත ගොඩනැගිල්ලෙහි 2 වන අදියරේ ඉදිකිරීම් විචලතාවයන් අනුමත කිරීම 2019 දෙසැම්බර් 6 දින වන විටත් සිදුකර නොතිබුණ ද ඒ සඳහා ගෙවීම් කර තිබුණි. | විචලතාවයන් අනුමත කර ගත යුතුවේ. | විචලතාවය හඳුනාගෙන අගය කිරීමට වැඩි කාලයක් ගත වන බව දන්වා ඇත. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දර්ශක 244 කින්, ඉලක්ක 169 කින් හා අරමුණු 17 කින් සමන්විත 2030 තිරසර සංවර්ධනය හා එම අරමුණුවලට ළඟාවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු ප්‍රගතිය මැනීම සඳහා වන දර්ශක හා උනන්දුවක් දක්වන පාර්ශව හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හා උනන්දුවක් දක්වන පාර්ශව හඳුනාගත යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

**5.** **යහපාලනය**

**-------------**

**5.1** **මහජනයා වෙත සේවා ඉටු කිරීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | හිඟුරක්ගොඩ සහ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුල ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයින් 1146 දෙනෙකු හඳුනාගෙන ඇති නමුත්, එම පුද්ගලයින් දැනුවත් කර ඔවුන්ට හැඳුනුම්පත් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් හැඳනුම්පත් නොමැති පුද්ගලයින් හඳුනාගෙන හැඳුනුම්පත් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් හැඳුනුම්පත් ලබාදීමට කටයුතු කරන බවට දන්වා ඇත. |
| (ආ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචිව සිටින නමුත් උප්පැන්න සහතිකයක් නොමැති පුද්ගලයන් සඳහා 2017 වසරේ සිදුකරන ලද ජංගම සේවා මගින් යොමුකරන ලද අයදුම්පත් අතරින් 2019 දෙසැම්බර් 31 දින වන විට ජාතික හැඳුනුම්පත් 243 ක් නිකුත් කර නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර නොතිබුණි. | පසුවිපරම් සිදුකර කඩිනමින් හැඳුනුම්පත් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | පසුවිපරම් සිදුකළ බවට දන්වා ඇත. |
| (ඇ) | වාර්ෂිකව වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද, දිඹුලාගල සහ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුල වකුගඩු දීමනාව හා වැඩිහිටි දීමනාව හිමිවිය යුතු සුදුසුකම්ලත් පුද්ගලයින් 1507 දෙනෙකුට පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදුවී තිබුණි. | ප්‍රතිපාදන වැඩියෙන් ලබාගෙන සුදුසුකම් ලත් සියලුදෙනාහට ප්‍රතිලාභය ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත අනුමත ප්‍රතිලාභීන්ට පමණක් ප්‍රතිලාභය ගෙවන බව දන්වා ඇත. |

**5.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පෙරළිය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් වෙත ඇස්බැස්ටෝස් තහඩු හා සිමෙන්ති බෙදීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවයන් පිළිබඳව පුළුල් පරීක්ෂණයක් අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරවා ගන්නා බව NCP/PL/DSPL/2019/AQ/02 අංක දරන විගණන විමසුමට ලබාදී තිබූ පිළිතුරෙහි දන්වා තිබුණද, එවැනි අභ්‍යන්තර විගණනයක් මෙතෙක් සිදුකර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් අනුව අභ්‍යන්තර විගණනයක් පැවැත්විය යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

5.3 **විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අගෝස්තු 07 දිනැති 06/2018 දරන ස්වදේශ කටයුතු චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යල මට්ටමෙන් ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වරක්වත් පැවැත්විය යුතු වුවත්, වැලිකන්ද, තමන්කඩුව, මැදිරිගිරිය, ලංකාපුර සහ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2019 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සෑම කාර්තුවක් සඳහාම ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටුවක් පැවැත්විය යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 01 සහ 02 ආකෘති පදනම් කරගෙන ඇලහැර, වැලිකන්ද, මැදිරිගිරිය, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීමට සහ මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත්, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි. | අදාල චක්‍රලේඛන විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මැදිරිගිරිය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඒ සඳහා ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බවට දන්වා ඇති අතර, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළිතුරු ලබාදී නොමැත. |